**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා වන**
**බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය**

1. සම්බන්ධ වන ආයතන.

   1.1 දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

   යොමු අංකය : CPC/CS/11/1/1/57 දිනය : 2015-09-03

   1.2 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය

   යොමු අංකය : CPC/CMS/1/2/1/8 දිනය : 2015-09-11

   1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම

   යොමු අංකය : 2014-01-01දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය

   1.4 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :

   යොමු අංකය : CPC/CS/2/3/SM/C/(IV) දිනය : 2015-12-03

   1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

   යොමු අංකය : NSCC/10/71/2/SR දිනය : 2016.05.30

   1.6 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :

   යොමු අංකය : CPC/PSC/29/3/1(1) දිනය : 2016.11.29

2. පත් කිරීමේ බලධාරියා : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්
3. සේවා ගණය පිළිබඳ විස්තර

   3.1. සේවා ගණය : ප්‍රාථමික අර්ධ ශිල්පීය

   3.2. ශ්‍රේණි :III ,II , I සහ විශේෂ ශ්‍රේණිය

   3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

   ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන ඉදිකිරීම්,නඩත්තු හා අලුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) දෙවැනි හෝ තෙවැනි මට්ටමේ ප්‍රවීණතා / කාර්මික නිපුණතාවයන් අවශ්‍යවන්නාවූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් ඒ ඒ තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

   3.4 කාර්යයන් පැවරීම :

   ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලැබිය හැකිය.

4. තනතුරෙහි ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය : PL2-2016

5.2. වැටුප් පරිමාණය : රු. 25,250-10x270-10x300-10x330-12x350 -38,450/=

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 පියවර | 25,250/= |
| II | 12 පියවර | 28,250/= |
| I | 22 පියවර | 31,280/= |
| විශේෂ | 32 පියවර | 34,600/= |

* වැටුප් ගෙවීම් හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

6. සේවා ගණයට අයත් අනුමත තනතුරු :

6.1. අනුමත තනතුරු නාම,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| යන්ත්‍ර ක්‍රියාකරු | III, II, I හා විශේෂ ශ්‍රේණිය | 01 | • ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ඇති තත්ත්ව පරීක්ෂණාගාරයේ උපකරණ, සම්පීඩන යන්ත්‍ර පිළිබඳ අවබෝධයකින් යුතුව නියමිත ශිල්පීය දැනුම උපයෝගී කරගෙන ක්‍රියාත්මක කිරීම<br>• යන්ත්‍ර ආරක්ෂිතව පරිහරණය කිරීම හා නඩත්තු කිරීම<br>• පැවරූ කාර්ය කාර්යක්ෂමතාවයෙන් හා අරපිරිමැස්මෙන් යුතුව ඉටු කිරීම<br>• මධ්‍යම පළාත තුළ කරනු ලබන තත්ත්ව පරීක්ෂාවන්ට අදාළ සේවාවන් කාර්යක්ෂමව, අනලස්ව ඉටු කරදීම.<br>ඉටු කිරීමට පැවරෙන පරීක්ෂණයන්<br>**Concrete Tests**<br>1. Compressive Strenght of Concrete (Cube Testing)<br>2. Compressive Strenght of Concrete (Hammer Testing)<br>**Soil Tests**<br>1. Standard Proctor Compaction Test<br>2. Atterberg Limit Test<br>3. Particle Size Distribution Test<br>4. Field Density Test<br>5. Natural Moisture Content Test<br>6. Hand Augur Investigations<br>**Other Tests**<br>1. Powder Coating Thickness Test<br>2. Measurement Checks |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01 කි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් සේ සැලකේ .

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත
ආණ්...

7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

මෙම තනතුර සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව 01 ක් බැවින් එම තනතුරු සඳහා සීමිත පදනම මත සුදුසුකම් සහිත අභ්‍යන්තර සේවකයන් අතුරින් බඳවා ගනු ලැබේ. එසේ නොමැති විට පමණක් බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා විවෘත පදනම මත බඳවා ගනු ලැබේ.

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.

7.2.2.3. පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම මධ්‍යම පළාත් ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් සුදුසුකම්:

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර 05ක ස්ථිර පදිංචිය තහවුරු විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.2.3. වයස :

7.2.3.1. අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

7.2.3.2. උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි

(රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන සේවකයන් හට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව තනතුරට බඳවාගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3 වෘත්තීය පරීක්ෂණය : ඇමුණුම 01

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | 50 | 25 |

7.2.4.3.1 පවත්වන බලධරයා : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :

මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යාංශ ලේකම්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය:

ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2017-01-09 දින අනුමත කරන ලදී. ආණ්ඩුකාර ලේකම්

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2. සුදුසුකම් :

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම.

7.3.2.2. වෘත්තිය සුදුසුකම් : තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික කුසලතාවන්හි (N.V.Q.) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තිය පාඨමාලාවක් හදාරා තිබීම.

7.3.2.3. පළපුරුද්ද : ප්‍රාථමික ශ්‍රේණියේ (ශිල්පීය නොවන) තනතුරක අවම වශයෙන් මධ්‍යම පළාතේ අවුරුදු 05ක් අඛණ්ඩ සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරක අවම වශයෙන් මධ්‍යම පළාතේ අවුරුදු 03ක අඛණ්ඩ සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවයේ ස්ථිර කර ඇති සේවකයින් වීම

7.3.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් සුදුසුකම්:

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
IV. බඳවාගනු ලබන දිනට මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචිය තහවුරු විය යුතුය. ඡන්ද හිමි නාම ලේඛනයේ/ග්‍රාම නිලධාරී සහතිකයේ පදිංචිය සහතික කළ යුතුය.

7.3.3. වයස :

7.3.3.1. අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

7.3.3.2. උපරිම සීමාව : අදාළ නොවේ



ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලකුණුවල අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.3.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3 වෘත්තීය පරීක්ෂණය : ඇමුණුම 01

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | 50 | 25 |

7.3.4.3.1 පවත්වන බලධරයා : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | |
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 20 | අදාළ නොවේ |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා :

මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය:

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

8. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද? | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ගත වීමට පෙර | ඇමුණුම 02 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ඇමුණුම 03 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගත වීමට පෙර | ඇමුණුම 04 |

8.2 කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :

අවශ්‍යතාවය පරිදි වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන් ද :

මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

9. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවට ලබා ගත යුතුය. |



ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

10. ශ්‍රේණි උසස් කිරීම

10.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවාගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක(10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක(9) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන ලද සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක(9) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන ලද සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

11. තනතුරු වලට පත්කිරීම : අදාළ නොවේ.

12. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම : අදාළ නොවේ.

13. අර්ථ නිරූපණ හා නිර්වචනය

13.1. "බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයෙහි යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියවේ.

13.2. "ආණ්ඩුකාරතුමිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමිය/තුමා වේ.

13.3. "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.4. "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වේ.

13.5. "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ඉංජිනේරු සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

13.6. "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා වේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

13.7. "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

13.8. "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ,රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද , සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

14. මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි , මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ රජය හා/හෝ පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටලුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමිය විමසා ගරු අණ්ඩුකාරතුමියගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**<u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ</u>**
**<u>ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ යන්ත්‍ර ක්‍රියාකරු III ශ්‍රේණියට</u>**
**<u>බඳවා ගැනීමේ විවෘත/සීමිත වෘත්තීය පරීක්ෂණය</u>**

01. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 1/2 | 50 | 25 |

02. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :
අවශ්‍යතාවය පරිදි පුරප්පාඩු ඇතිවිට

04.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය නිර්දේශය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම | 20 | 25 |
| යන්ත්‍රෝපකරණ සවි කිරීම, ක්‍රියාකරවීම පිළිබඳ දැනුම | 15 | |
| යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම පිළිබඳ දැනුම | 15 | |



ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 02

**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වන**
**01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. විභාගය පිළිබඳ විස්තර : වාචික පරීක්ෂණයක් මගින් තනතුරට අදාළ දැනුම පරීක්ෂා කෙරේ.

02. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යනවග :
අවශ්‍යතාවය පරිදි වසරකට දෙවරක්

04. විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| • තනතුරට අදාළව පැවරෙන කාර්යයන් පිළිබඳ අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම.<br>• සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම.<br>• තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන දැනුම හා ප්‍රවීණතාවයන් අත්පත් කරගෙන ඇත්දැයි මැන බැලීම. | 100 | 40% |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 ..... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වන**
**02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

02. විභාගය පිළිබඳ විස්තර : වාචික පරීක්ෂණයක් මගින් තනතුරට අදාළ දැනුම පරීක්ෂා කෙරේ.

03. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යනවග : අවශ්‍යතාවය පරිදි වසරකට දෙවරක්

04. විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| • පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයන්ට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය වෙනස්වීම් පිළිබදව සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයන්ට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම. | 100 | 40% |



ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වන**
**03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

04. විභාගය පිළිබඳ විස්තර : වාචික පරීක්ෂණයක් මගින් තනතුරට අදාළ දැනුම පරීක්ෂා කෙරේ.

05. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යනවග :
අවශ්‍යතාවය පරිදි වසරකට දෙවරක්

04. විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| • පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයන්ට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය වෙනස්වීම් පිළිබඳව සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයන්ට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම | 100 | 40% |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-01-09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය නිර්දේශ කරමු -:

01.ගාමිණී දසනායක මහතා (සභාපති) ..............................................

02. යූ.ඒ.බෝගහපිටිය මහතා (සාමාජික) ..............................................

03. ජී.ජී.එස්.ඒ.දිසානායක මිය (සාමාජික) ..............................................

04. වෛත්‍යලිංගම් නන්දකුමාර් මහතා (සාමාජික) ..............................................

05. ඒ.ජේ.එම්.මොහිදින් නිස්තාර් මහතා (සාමාජික) A. J. M. M. ..............................................

දිනය.2016.11.29

ආණ්ඩුකාර ලේකම්,

2016.11.29...... දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 16/1789.... යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2016.12.09

ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

..............................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :- අනුමත කරමි/නොකරමි.

අනුමත කරමි / නොකරමි

..............................................
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 17-01-09